# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,688 — 1966 මාර්තු 25 වැනි සිකුරාද — 1966.3.25

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන .. .. .. | 237 | ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන .. .. .. | — |
| තනතුරු–ඇබෑර්තු .. .. .. .. | 239 | අය–වැය ලේඛන .. .. .. | 242 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය .. .. .. | 242 | දේපළ විකිණීම .. .. .. | — |
| අතුරු ව්‍යවස්ථා .. .. .. | — | මාර්ග කොමිටි දැන්වීම් .. .. .. | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. .. | — | විවිධ දැන්වීම් .. .. .. | 242 |


## පළාත් පාලන නිවේදන

### යටියන්තොට සුළු නගර සභාව

#### ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ 3 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ව්‍යවස්ථාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 මාර්තු මස 9 වැනි දින,
කොළඹ දීය.

ව්‍යවස්ථාව

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ පනවනු ලැබ, 1919 අප්‍රේල් 4 වැනි දින අංක 7,004 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, 1943 අප්‍රේල් 9 වැනි දින අංක 9,108 දරනු ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ව්‍යවස්ථාවෙන් අන්තිම වරට සංශෝධනය කරන ලද්දාවූද, ව්‍යවස්ථා, යටියන්තොට සුළු නගර සභාවේ පරිපාලන සීමා ඇතුළතවූ ප්‍රදේශයට අදාළ වනතාක් දුරට, එහි අ3 වැනි ව්‍යවස්ථාවේ දැක්වෙන ගාස්තු ක්‍රමය වෙනුවට පහත සඳහන් අලුත් ගාස්තු ක්‍රමය ආදේශ කිරීමෙන් තවදුරටත් ඒ ව්‍යවස්ථා මෙයින් සංශෝධනය කරනු ලැබේ.

| | දිනකට | | මසකට | | දෙසැම්බර් 31 වැනි දයින් අවසන්වන වර්ෂයකට | |
|---|---|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 199 ට වැඩි නොවන විට ... ... | 5 | 0 | 25 | 0 | 100 | 0 |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 199 ට වැඩි, නමුත් 399 ට වැඩි නොවන විට ... | 10 | 0 | 50 | 0 | 150 | 0 |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 399 ට වැඩි වන විට. ... ... ... | 15 | 0 | 75 | 0 | 200 | 0 |

3–1267—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

## විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1966 පෙබරවාරි මස 11 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

ඇල්.ඞී.—බී. 69/41
ප.පා.දෙ.—ජී.ඒ. 1/24

### ගම්සභා ආඥපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 37 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම, බදුල්ල දිස්ත්‍රික්කයේ මඩොල්සිම ගම් ප්‍රදේශයේ ගම්සභාවට ඒ ගම් ප්‍රදේශයෙහි ඉඩම් බද්දක්, ඒ වගන්තිය යටතේ පනවා අය කිරීමට මේ නිවේදනයෙන් බලය පවරමි.

M. TIRUCHELVAM,
පළාත් පාලන ඇමති.

1966 මාර්තු මස 9 වැනි දින,
කොළඹ.

3–1276—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඞී—බී 69/41
ප.පා.දෙ—ජී.ඒ. 1/8

### ගම්සභා ආඥපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වන අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 37 වන වගන්තියේ 1 වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම, බදුල්ල දිස්ත්‍රික්කයේ සොරණාතොට ගම් ප්‍රදේශයේ ගම්සභාවට ඒ ගම් ප්‍රදේශයෙහි ඉඩම් බද්දක්, ඒ වගන්තිය යටතේ පනවා අයකිරීමට මේ නිවේදනයෙන් බලය පවරමි.

M. TIRUCHELVAM,
පළාත් පාලන ඇමති.

1966 මාර්තු මස 9 වැනි දින,
කොළඹදීය.

3–1275—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඞී.—බී. 69/41
ප.පා.දෙ.—ජී.ඒ. 1/28

### ගම්සභා ආඥපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 37 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම, බදුල්ල දිස්ත්‍රික්කයේ ඌව-පරණගම ගම් ප්‍රදේශයේ ගම්සභාවට, ඒ ගම් ප්‍රදේශයෙහි ඉඩම් බද්දක් ඒ වගන්තිය යටතේ පනවා අය කිරීමට මේ නිවේදනයෙන් බලය පවරමි.

M. TIRUCHELVAM,
පළාත් පාලන ඇමති.

1966 මාර්තු මස 9 වැනි දින,
කොළඹ දීය.

3–1274—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඞී.—බී. 69/41
ප.පා.දෙ.—ජී.ඒ. 1/17

### ගම්සභා ආඥපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 37 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම, බදුල්ල දිස්ත්‍රික්කයේ මැටිගහතැන්න ගම් ප්‍රදේශයේ ගම්සභාවට ඒ ගම් ප්‍රදේශයෙහි ඉඩම් බද්දක්, ඒ වගන්තිය යටතේ පනවා අයකිරීමට මේ නිවේදනයෙන් බලය පවරමි.

M. TIRUCHELVAM,
පළාත් පාලන ඇමති.

1966 මාර්තු මස 9 වැනි දින,
කොළඹ දී ය.

3–1273—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥපනත

**13 වැනි වගන්තිය යටතේ දැන්වීම**

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධන) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥපනතෙහි 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර යාපනය උතුරු (ඉහළ) කොට්ඨාශයේ සහකාර පළාත් පාලන කොමසාරිස්, සිවසුබ්‍රමනියම් චින්මයා නන්දගුරු මානිකවාසගර් වන මම යාපනය දිස්ත්‍රික්කයේ පුලෝලි ගම්සභාවේ අංක 5 දරණ කොට්ඨාශයේ සභික ඒ. කේ. සුබ්‍රමනියම් මහත්මයා, සභාවට දන්වීමක් නොමැතිව, පිළිවෙලින් සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට, තමන් තෝරා පත්කර ගැනීමෙන් පසු නොපැමිණි බව සෑහීමකට පත්ව, යාපනය දිස්ත්‍රික්කයේ පුලොලි ගම්සභාවෙහි අංක 5 දරණ කොට්ඨාශයේ සභික ඒ. කේ. සුබ්‍රමනියම් මහත්මයා මේ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළකිරීමේ දින සිට සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

ඇස්. සී. මානිකවාසගර්,
සහකාර පළාත් පාලන කොමසාරිස්,
යාපනය උතුරු (ඉහළ).

1966 මාර්තු මස 8 වැනිදා,
යාපනයේ උතුරු (ඉහළ) පළාත් පාලන
කාර්යාලයේ දීය.

3–1272—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

---

### මන්නාරම් නගර සභා සංස්ථාපනය

දැනට මන්නාරම් සුළු නගර සභාව විසින් පාලනය කරගෙන යනු ලබන ප්‍රදේශයත්, අවශ්‍ය වුවහොත් ඊට යාබද ප්‍රදේශයත් සඳහා නගර සභාවක් සංස්ථාපනය කිරීමට යෝජනා කර තිබේ. මේ යෝජනාව සම්බන්ධයෙන් සැළකිල්ලක් දක්වන සමිති සමාගම් විසින් හෝ පුද්ගලයන් විසින් ඒ පිළිබඳව තමතමන්ට කියන්නට තිබෙන කරුණු මෙම දැන්වීමේ සඳහන් වන දින සිට මාසයක් ඇතුළතදී මෙහි පහත සඳහන් ලිපිනය වෙත ලියා දන්වන මෙන් ඉල්ලමි :—

පළාත් පාලන කොමසාරිස්,
තැ. පෙ. 500,
කොළඹ 1.

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
පළාත් පාලන කොමසාරිස්.

1966 මාර්තු මස 18 දින,
කොළඹ දී ය.

3–1290—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

---

### ශුද්ධි පත්‍රයයි

**සමන්තුරෙයි (නැගෙනහිර) ගම්සභාව**

### ගම්සභා ආඥපනත හා ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥපනත

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 11 වැනි වගන්තියෙන් සහ (262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥපනතේ 84 වැනි වගන්ති යටතේ සම්පාදිතව අංක 143686/2 හා 1966 මාර්තු 11 වැනි දින අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ 1966 මාර්තු මස 12 වැනි දින දරන ආඥාවෙහි දැක්වෙන "මඩකලපු දිස්ත්‍රික්කයේ" යන්න "අම්පාරෙයි දිස්ත්‍රික්කයේ" යනුවෙන් කිය විය යුතු ය.

3–1050—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

**5. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම, තමා ලාංකික යකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

**6. සේවා මුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවා මුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවලට නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම, අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරු වනට අවසර දෙනු ලැබේ.

**7. වයස පිළිබඳ අනුග්‍රහය.**—**පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවක් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.**

**8. වෙනත් අවශ්‍ය කරුණු.**—**(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ සභාපති මඟින් හෝ නාගරික කොමසාරිස්වරයා මඟින් හෝ ඉදිරිපත් කළ යුතුයි.**

**(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාහරින්නට තමන් සූදානම්ව සිටින් ද නැත් දැයි සඳහන් කළ යුතුය.**

**(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.**

**(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.**

**(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යෙන් පසු කරනු ලැබීමටත් ඉඩ තිබේ.**

**(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට සර්ව ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**(vii) අයදුම්පත් වනාහි මීට යාකොට ඇති ආකෘතියට අනුව සාරානුකූලව පිළියෙල කොට, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.**

**(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපෑලේ දී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.**

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

**(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට** අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ සවකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි-සිංහල, දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වෙනම වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

## තනතුර සඳහාවූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය : ————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැදහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| | පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

වෘත්තීය /ශිල්පීය අධ්‍යාපනය

| | විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—
   (අ) සිංහල :————.
   (ආ) ඉංග්‍රීසි :————.
   (ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම්. ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්‍ෂා (පත් වූ දිනයන් හා අස්වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න):————.
   (ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ සථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්‍ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.
   (ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු), පළාත් පාලනායතන හා කාලසීමාවන් : ————.
   (ඇ) දැනට කරන රක්‍ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :
   (i) තනතුරේ පදවි නාමය. ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.
   (ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය : ————.
   (iii) විශ්‍රාම වැටුප් සහිතද :————.
   (ඉ) සේවා මුක්ත භටයෙක් නම් —
   සේනාංකය තරාතිරම, සේවය බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.
   (අ) සිංහල :————.
   (ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ඈදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.
   (ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### ක්‍රේන් රියැදුරු තනතුර—නාගරික කම්හල් දෙපාර්තමේන්තුව

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අයැදුම් පත් කැඳවනු ලැබේ.

2. **වැටුප.**—තනතුරට අදාළ වැටුප වසරකට රුපියල් 1,170—42—රුපියල් 1,674 කි.

3. **අවශ්‍ය සුදුසුකම් :—**
   (අ) **වයස.**—1966.4.17 දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (උප්පැන්න සහතිකයේ පිටපතක් අයැදුම් පතට අමුනා එවිය යුතු අතර, මේ සම්බන්ධයෙන් දිව්රුම් පෙත්සම් පිළිගනු නො ලැබේ.)
   (ආ) ක්‍රේන් යන්ත්‍ර ක්‍රියා කරවීමේ ප්‍රවීණතා සහතිකයක් අයැදුම්කරුවනට තිබිය යුතුයි. (සහතිකයෙහි පිටපතක් අමුණා එවිය යුතුයි.)

4. පළාත් පාලන සේවයෙහි සථිර තනතුරු දරන්නෝ, අවශේෂ වශයෙන් තනතුර උදෙසා සුදුසුකම් ලබා තිබේ නම්, ඔවුන් එවන අයැදුම්පත් පිළිබඳ වයස් සීමාව ගණන් නොගෙන සලකා බලනු ලැබේ.

5. මෙම ගැසට් පත්‍රයෙහි IV වෙනි කොටසේ ආරම්භයෙහි පළකර ඇති, පළාත් පාලන සේවයෙහි පත්වීම් වලට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි සැළකිල්ල යොමු කරවමි.

6. පත්වීම් වලට අදාළ වන පොදු කොන්දේසි අවසානයෙහි ඇති ආකෘති පත්‍රය අනුව පිළියෙළ කරන ලද අයැදුම් පත් 1966.4.17 දිනට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුයි.

7. අයැදුම්පත් හෝ ඒ හා සම්බන්ධ වෙනත් ලියකියවිලි හෝ එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපතිතුමා වෙත මිස පෞද්ගලිකව මේ දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකු නමට නොවේ.

8. නියමිත දිනට පසුව, රජයේ හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයක සේවය කරන නිලධාරීන්ගෙන් මෙම කාර්යාලයයට ලැබෙන අයදුම් පත්‍ර, අවසාන දිනට පළමු ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයයේ නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිතුමා වෙත හෝ ලැබී, ඒ බව සහතික කර, ප්‍රමාදයට හේතු දක්වමින්, ඒ අයැදුම්පත් භාරගන්නා ලෙස ඔවුන් විසින් නිර්දේශ කරනු ලැබුව හොත් මිස, සලකා බලනු නොලැබේ.

9. සුදුසුකම් ඇති අයැදුම්කරුවන්ගේ අයැදුම්පත් පමණක් ලැබුණ බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 මාර්තු මස 17 දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.

3–12:8—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### කාර්යාල කාර්ය සහායක තනතුර—යගම්පත්තු ගම් සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**— වර්ෂයකට රුපියල් 540—22 × 12—රු. 804 ; රු. 636 සහ රු. 732 යන වාර්ෂික වැටුප් වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

3. **අවශ්‍ය සුදුසුකම් :—**
   (අ) **වයස.**— 1966 අප්‍රේල් මස 15 වැනි දිනට වයස අවුරුදු 20 ට නොඅඩු, 30 ට නොවැඩි විය යුතුයි.
   (ආ) අපේක්ෂකයෝ සිංහල 6 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බලමණ්ඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සරානුකූලව පිළියෙළ කොට, 1966 අප්‍රියෙල් මස 15 වැනි දිනට හෝ ඊට පළමු යගම්පත්තු ගම් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

ඩබ්ලිව්. ජේ. හේරත් ගුණරත්න.
යගම්පත්තු ගම් සභාවේ සභාපති.

1966 මාර්තු මස 18 වැනි දින,
යගම්පත්තු ගම්සභා කාර්යාලයේ දී ය. මාදම්පේ.

3–1189—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

**මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය—1966.1.27**

ඉහත සඳහන් විභාගයෙන් පහත සඳහන් අපේක්ෂකයින් සමත් වී ඇති බැව් මෙයින් දන්වනු ලැබේ :—

| | |
|---|---|
| 1. අබයරත්න, එම්. ටී. එච්. | කොළඹ නාගරික සභාව |
| 2. ආනන්දගොඩ, එස්. | —එම— |
| 3. ගානි, එම්. එල්. | —එම— |
| 4. ජයසිංහ, ඩී. ජේ. ඒ. | —එම— |
| 5. කුමාරගුරු, ජී. | කොළඹ නගර සභාව |
| 6. පානලුව, පී. වී. | —එම— |
| 7. සවුන්දනායගම්, ඒ. පී. සී. | මහනුවර නාගරික සභාව |
| 8. වෙබ්ස්ටර්, සී. ඩබ්. | කොළඹ නාගරික සභාව |

ඩබ්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

නැ. පෙ. 530,
කොළඹ, 1966 මාර්තු මස 14 දින.

3–1257—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

# අය-වැය ලේඛන

## මිනුවන්ගොඩ සුළු නගර සභාව

**1966 පළමුවෙනි පරිපූරක අය-වැය ලේඛනය**

| වැය ශීර්ෂය | | ගණන රු. ශ. |
|---|---|---|
| ඒ.—1 (සී) ඕවර්සියර් වැටුප් | ... | 1,000 00 |
| ඒ.—3 ආපසු ගෙවීම් | ... | 50 00 |
| ඩී.—6 (ඒ) වැටුප් | ... | 1,000 00 |
| ඩී.—6 (බී) නඩත්තු කිරීම ... | ... | 750 00 |
| ඩී.—6 (ඩී) ජීවන හා විශේෂ ජීවනාධාර | ... | 1,000 00 |
| ඩී.—6 (ඊ) බෙහෙත් ද්‍රව්‍ය ... | ... | 3,000 00 |
| ඩී.—6 (ඇජ්) උපකරණ ... | ... | 1,000 00 |
| | | 7,800 00 |

1966 පෙබරවාරි 28 වන දින පැවැත්වූ, මිනුවන්ගොඩ සුළු නගර සභා මාසික රැස්වීමේදී, ඉහත සඳහන් පරිපූරක අයවැය ලේඛණය අංක 6 (ආ) දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

ඩී. ඒ. තෙන්නකෝන්,
වැ. බ. සභාපති,
සුළු නගර සභාව, මිනුවන්ගොඩ.

1966 මාර්තු 14 වන දින,
මිනුවන්ගොඩ සුළු නගර සභා කායර්‍යාලයේදීය.

3–1263—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## යටිනුවර ගඟපළාත ගම් සභාව

**ගෝඝාතන ආඥාපනත**

මෙහි පහත දක්වෙන උපලේඛණයේ සඳහන් අය විසින් එහි ඉදිරි පිටින් දක්වා ඇති ස්ථානයේ මරණ ලද හරක් මස් ගෙනවිත් විකිණීම පිණිස 1966 යේ වර්ෂයට බලපත්‍රයක් ඉල්ලා මා වෙත අයදුම් පතක් ඉදිරිපත් කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ගඟපළාත ගම්සභාව සීමාවතුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමන හේතුවක් නිසාද ? යන වග ඇතුළත් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දවස් 14 ක් ඇතුලත මා වෙත එවිය යුතු බවත්, ගෝඝාතන ආඥාපනතේ (272 වෙනි පරිච්ඡේදයේ) අංක 7 දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

**උපලේඛනය**

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| අයි. ඇල්. ඇම්. ඇස්. ඩීන්, 15, යටිනුවර වීදිය, මහනුවර | ගවමස් විකිණීම ... | 69/3, නරදෙනියහේන, පහළ ඊරියගම |

ටී. බී. දිසානායක,
යටිනුවර ගඟපළාත ගම්සභාවේ ප්‍රධාන තැන.

ගම්සභා කායර්‍යාලය,
මුරුතලාව,
වර්ෂ 1966 මාර්තු 10 දින.

3–1271—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය යටතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හන්වැල්ල පේරුව ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

**යෝජනාව**

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වන දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල XXXVIII වන කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවූ දින සිට සම්මත කර ගැනීමට හන්වැල්ල පේරුව ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වන අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

පී. පී. අත්තනායක,
හන්වැල්ල පේරුව ගම්සභාවේ සභාපති.

1966 මාර්තු 15 දින,
ගම්සභා කායර්‍යාලය, හන්වැල්ල.

3–1266—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

## මහනුවර දිස්ත්‍රික්කයේ පා. දු. පලිස්පත්තු බටහිර ගම්සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයේ 1966 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍ර ඉල්ලා අයදුම් පත්‍රයක් මා වෙත ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වෙනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ පා. දු. පලිස්පත්තු බටහිර ගම්සභා ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එය කුමණ කරුණක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට 14 දිනක් ඇතුළත මා වෙත එවිය යුතු බව දන්වා සිටිමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළඳාම |
|---|---|
| (1) කේ. මොහිදීන් බාවා කුඹුක්කඳුර, තෙල්දෙනිය. | ... අංක 117, කුඹුක්කඳුර, ගව මස් |

එම්. ජේ. බී. ඒකනායක,
පා. දු. පලිස්පත්තුව බටහිර ගම්සභාවේ සභාපති.

1966 මාර්තු මස 10 වෙනි දින,
දිගන, කෙන්ගල්ල.

3–1291—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

---

## දික්වැල්ල ගම්සභාව

**ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)**

ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය ප්‍රකාර නිසි බලධරයාවූද දික්වැල්ල ගම්සභාවේ සභාපති තැනවූද සී. ඊ. විජේසූරිය වන මම 1966 වර්ෂය තුළදී පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන දින වල මාතර දිස්ත්‍රික්කයේ දික්වැල්ල ගම්සභා සීමා ඇතුළත මස් පිණිස සතුන් මැරීම හෝ මස් විකිණීම හෝ මස් විකිණීම පිණිස ප්‍රදර්ශනය කිරීම හෝ සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

සී. ඊ. විජේසූරිය,
දික්වැල්ල ගම්සභාවේ සභාපති.

1966 මාර්තු මස 10 වන දින,
දික්වැල්ල ගම්සභා කාර්යාලයේ දිය.

### උපලේඛනය

1966 මාර්තු 13 පෝය දිනය
1966 මාර්තු 20 පෝය දිනය
1966 මාර්තු 28 පෝය දිනය
1966 අප්‍රේල් 4 පෝය දිනය
1966 අප්‍රේල් 12 පෝය දිනය
1966 අප්‍රේල් 19 පෝය දිනය
1966 අප්‍රේල් 27 පෝය දිනය
1966 මැයි 3 වෙසක් පසලොස්වක දිනට පෙර දින
1966 මැයි 4 වෙසක් පෝය දින
1966 මැයි 12 පෝය දිනය
1966 මැයි 19 පෝය දිනය
1966 මැයි 27 පෝය දිනය
1966 ජූනි 2 පෝය දිනය
1966 ජූනි 10 පෝය දිනය
1966 ජූනි 17 පෝය දිනය
1966 ජූනි 25 පෝය දිනය
1966 ජූලි 2 පෝය දිනය
1966 ජූලි 10 පෝය දිනය
1966 ජූලි 17 පෝය දිනය
1966 ජූලි 24 පෝය දිනය
1966 ජූලි 31 පෝය දිනය
1966 අගෝස්තු 9 පෝය දිනය
1966 අගෝස්තු 15 පෝය දිනය
1966 අගෝස්තු 22 පෝය දිනය
1966 අගෝස්තු 30 පෝය දිනය
1966 සැප්තැම්බර් 7 පෝය දිනය
1966 සැප්තැම්බර් 14 පෝය දිනය
1966 සැප්තැම්බර් 21 පෝය දිනය
1966 සැප්තැම්බර් 28 පෝය දිනය
1966 ඔක්තෝබර් 7 පෝය දිනය
1966 ඔක්තෝබර් 13 පෝය දිනය
1966 ඔක්තෝබර් 20 පෝය දිනය
1966 ඔක්තෝබර් 28 පෝය දිනය
1966 නොවැම්බර් 5 පෝය දිනය
1966 නොවැම්බර් 11 පෝය දිනය
1966 නොවැම්බර් 19 පෝය දිනය
1966 නොවැම්බර් 27 පෝය දිනය
1966 දෙසැම්බර් 4 පෝය දිනය
1966 දෙසැම්බර් 11 පෝය දිනය
1966 දෙසැම්බර් 19 පෝය දිනය
1966 දෙසැම්බර් 26 පෝය දිනය

3–1284—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

---

## දිවුලපිටිය ගම්සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයන්හි 1966 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස බලපත්‍ර ඉල්ලා තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන දිවුලපිටිය ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එය කුමන හේතුන් නිසාද යන වග පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය |
|---|---|
| (1) ඊ. ඇම්. ප්‍රනාන්දු, මාඑලිය, ජාඇල | බල්ලපාන. |

ඇන්. සකලසූරිය,
දිවුලපිටිය ගම්සභාවේ සභාපති තැන.

ගම්සභා කාර්යාලය,
දූනගහ, 1966. 3. 15.

3–1261—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

## බිංගිරිය ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අයවළුන් විසින් සතුන් මරා මස් විකිණීම පිණිස 1966 වර්ෂයට බලපත්‍ර ඉල්ලා තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව බිංගිරිය ගම්සභා සීමාව තුල පදිංචි ඕනෑම කෙනෙකුට ඒ සඳහා තමා විරුද්ධ වන්නේ අසවල් කාරණා නිසායැයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, 1947 අංක 44 දරණ ආඥාපනතේ 6 වැනි ඡේදයෙන් සංශෝධිත, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (201 පරිච්ඡේදය) 7 (2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳම |
|---|---|---|
| ඩබ්ලිව්. පර්සි ප්‍රනාන්දු | ... මාරගහවත්ත/මූකලන්හේන | ඌරුමස් |
| ඩබ්ලිව්. ජුවන් ප්‍රනාන්දු | ... තල්ගහපිටිය | ...ඌරුමස් |
| ඒ. ඇල්. මොහම්මදු ඉස්මායිල් | ... වැවඉහළවත්ත/වීරපොකුණ | ... හරක්මස් |

1966 මාර්තු මස 8 දින,
බිංගිරිය,
ගම්සභා කාර්යාලයේ දීය.

කේ. පී. ඒ. මාලනාව,
බිංගිරිය ගම්සභාවේ සභාපති.

3–1280—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

---

## පන්නල ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත
### (272 වැනි අධිකාරිය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වැනි අධිකාරියේ 17 (1) වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලයේ ප්‍රකාර නියමිත අධිකාරි තැනවූ පන්නල ගම්සභාවේ සභාපති ඩී. ඇම්. ජයතිලක වන මම 1966 වර්ෂයේදී පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් දිනවල කුරුණෑගල දිස්ත්‍රික්කයේ මැදපත්තු බස්නාහිර කෝරළේ පන්නල ගම්සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ මස් වෙළඳාම කිරීම සම්පූර්ණයෙන් තහනම් කරමි.

ඩී. ඇම්. ජයතිලක,
පන්නල ගම්සභාපති.

1966 මාර්තු මස 10 වැනිද
පන්නල ගම්සභා කාර්යාලයේ දී,
යක්විල.

### උපලේඛනය

1966 අප්‍රේල් 4 පෝය දිනය
1966 අප්‍රේල් 8 මහ සිකුරාද
1966 අප්‍රේල් 12 පෝය දිනය
1966 අප්‍රේල් 19 පෝය දිනය
1966 අප්‍රේල් 27 පෝය දිනය
1966 මැයි 3 වෙසක් පසළොස්වකට පෙර දිනය
1966 මැයි 4 වෙසක් පෝය දිනය
1966 මැයි 11 පෝය දිනය
1966 මැයි 18 පෝය දිනය
1966 මැයි 26 පෝය දිනය
1966 ජූනි 2 පෝය දිනය
1966 ජූනි 10 පෝය දිනය
1966 ජූනි 17 පෝය දිනය
1966 ජූනි 25 පෝය දිනය
1966 ජූලි 2 පෝය දිනය හා මහමත්තුමාගේ උපන් දිනය
1966 ජූලි 9 පෝය දිනය
1966 ජූලි 16 පෝය දිනය
1966 ජූලි 24 පෝය දිනය
1966 ජූලි 31 පෝය දිනය
1966 අගෝස්තු 8 පෝය දිනය
1966 අගෝස්තු 15 පෝය දිනය
1966 අගෝස්තු 23 පෝය දිනය
1966 අගෝස්තු 30 පෝය දිනය
1966 සැප්තැම්බර් 6 පෝය දිනය
1966 සැප්තැම්බර් 13 පෝය දිනය
1966 සැප්තැම්බර් 21 පෝය දිනය
1966 සැප්තැම්බර් 28 පෝය දිනය
1966 ඔක්තෝම්බර් 4 සමස්ත ලෝක සත්ව දිනය
1966 ඔක්තෝම්බර් 6 පෝය දිනය
1966 ඔක්තෝම්බර් 13 පෝය දිනය
1966 ඔක්තෝම්බර් 21 පෝය දිනය
1966 ඔක්තෝම්බර් 28 පෝය දිනය
1966 නොවැම්බර් 4 පෝය දිනය
1966 නොවැම්බර් 11 පෝය දිනය සහ දීපවාලි උත්සවය
1966 නොවැම්බර් 19 පෝය දිනය
1966 නොවැම්බර් 26 පෝය දිනය
1966 දෙසැම්බර් 4 පෝය දිනය
1966 දෙසැම්බර් 11 පෝය දිනය
1966 දෙසැම්බර් 19 පෝය දිනය
1966 දෙසැම්බර් 26 පෝය දිනය

3–1277—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

---

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ නෑගම්පහ කෝරළේ ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත පෙන්නුම් කරණ උපලේඛනයේ සඳහන් අය විසින් එහි දැක්වෙන ස්ථානයන්හි 1966 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍ර ඉල්ලා අයදුම්පත් මා වෙත එවා තිබෙණ බැවින් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 261 වැනි පරිච්ඡේදයේ අංක 44 දරන සංශෝධිත ආඥාපනතේ 6 වැනි වගන්තියෙන් සංශෝධනය කරණලද 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන නෑගම්පහ කෝරළේ ගම් සභා සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වනුයේ කුමණ හේතුන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලතදී මා වෙත එවිය යුතු බවද මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| 1. ආර්. මුත්තු කෝයා, නෑගම, නෑගම්පහ ... | හරක් මස් ... | නෑගම |
| 2. ඇම්. සරිබුදීන්, නෑගම, නෑගම්පහ ... | හරක් මස් ... | නෑගම |

යූ. බී. විජේකෝන්,
නෑගම්පහ කෝරළේ ගම් සභාවේ
සභාපති තැන.

ගම් සභා කායර්‍යාලය,
නෑගම්පහ,
1966. 3. 8. දින.

3-1281—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

## පොළොන්නරුව මැද පත්තු උතුරු ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන අය විසින් 1966 වෙනි වර්ෂයට මස් පිණිස සතුන් මැරීමට හා කඩයක් පවත්වා ගෙන යාමට බල පත්‍ර ඉල්ලුම් කර සිටින බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන පොළොන් නරුව මැද පත්තු උතුරු ගම් සභාව සීමාව තුළ පදිංචි යම් කෙනෙකු විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිට පත් දෙකෙකින් යුත් ලියවිල්ලකින් මෙම ගැසට් පත්‍රයේ දැන්වීම පලවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් මරන්නන් පිළිබඳ ආඥා පනතේ 272 පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳම | පිහිටි ස්ථානය |
|---|---|---|
| ඒ. ඇම්. අබුසාලි ... | එළ හරක් මස් ... | බීඹපි 314/10, මුස්ලිම් ජනපදය, තඹාල, පොළොන්නරුව |

ඇස්. ඒ. ඒ. මජීඩ්,
මැද පත්තු උතුරු ගම් සභාවේ සභාපති තුමා.

1966ක් වූ මාර්තු මස 14 වෙනි දින,
මැද පත්තු උතුරු ගම් සභා කාර්‍යාලයේදීය.

3–1262—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

## තෙල්දෙණිය සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ

### (272 වැනි අධිකාරියේ) 17 (1) වගන්තිය යටතේ නියෝගය

272 වැනි අධිකාරිය දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපණතේ 17(1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නිසිබලධාරියා වූ තෙල්දෙණිය සුළු නගර සභාවේ සභාපති ජේ. ඩබ්ලිව්. ඇම්. විජේරත්න වන මම 1966 වර්ෂයේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් වන දින වලදී තෙල්දෙණිය සුළු නගර සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම මෙයින් තහනම් කරමි.

මේ සම්බන්ධව අංක 14,669 හා 1966.2.11 වැනි දින දරණ ගැසට් පත්‍රයේ පළ කරණ ලද නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ.

ජේ. ඩබ්ලිව්. ඇම්. විජේරත්න,
සභාපති,
තෙල්දෙණිය සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්‍යාලය,
තෙල්දෙණිය.
1966 මාර්තු මස 15 වෙනි දින.

### උපලේඛනය

| | |
|---|---|
| 1966 ජනවාරි 6 වෙනි දින | 1966 ජූලි 1 සහ 31 වෙනි දින |
| 1966 පෙබරවාරි 4 වෙනි දින | 1966 අගෝස්තු 30 වෙනි දින |
| 1966 මාර්තු 6 වෙනි දින | 1966 සැප්තැම්බර් 28 වෙනි දින |
| 1966 අප්‍රේල් 4 වෙනි දින | 1966 ඔක්තෝබර් 28 වෙනි දින |
| 1966 මැයි 3 සහ 4 වෙනි දින | 1966 නොවැම්බර් 27 වෙනි දින |
| 1966 ජූනි 2 වෙනි දින | 1966 දෙසැම්බර් 26 වෙනි දින |

3–1265—66.3.25 දින අංක 14,688 දරන ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. සියළුම දයක **මුදල් කොළඹ මහ ලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය.**

උපලේඛනය

**1966**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| මාර්තු | 66. 3. 4 | සිකුරාද | 66. 2.25 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.11 | සියුරාද | 66. 3. 4 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.18 | සිකුරාද | 66. 3.11 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.25 | සිකුරාද | 66. 3.17 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| අප්‍රේල් | 66. 4. 1 | සිකුරාද | 66. 3.25 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4. 7 | බ්‍රහස්පතින්ද | 66. 3.31 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66. 4.15 | සිකුරාද | 66. 4. 1 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4.22 | සිකුරාද | 66. 4.15 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4.29 | සිකුරාද | 66. 4.22 | සිකුරාද | ප.ව. 3.30 |
| මැයි | 66. 5. 6 | සිකුරාද | 66. 4.26 | අඟහරුවාද | දවල් 12 |
| | 66. 5.13 | සිකුරාද | 66. 5. 6 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 5.20 | සිකුරාද | 66. 5.13 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 5.27 | සිකුරාද | 66. 5.20 | සිකුරාද | ප.ව. 3.30 |
| ජූනි | 66. 6. 3 | සිකුරාද | 66. 5.25 | බදාද | දවල් 12 |
| | 66. 6. 9 | බ්‍රහස්පතින්ද | 66. 6. 1 | බදාද | දවල් 12 |
| | 66. 6.16 | බ්‍රහස්පතින්ද | 66. 6. 9 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66. 6.24 | සිකුරාද | 66. 6.16 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| ජූලි | 66. 7. 1 | සිකුරාද | 66. 6.24 | සිකුරාද | දවල් 12 |
| | 66. 7. 8 | සිකුරාද | 66. 7. 1 | සිකුරාද | දවල් 12 |
| | 66. 7.15 | සිකුරාද | 66. 7. 8 | සිකුරාද | දවල් 12 |
| | 66. 7.22 | සිකුරාද | 66. 7.14 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66. 7.29 | සිකුරාද | 66. 7.22 | සිකුරාද | ප.ව. 3.30 |
| අගෝස්තු | 66. 8. 5 | සිකුරාද | 66. 7.29 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.12 | සිකුරාද | 66. 8. 5 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.19 | සිකුරාද | 66. 8.12 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.26 | සිකුරාද | 66. 8.19 | සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් | 66. 9. 2 | සිකුරාද | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9. 9 | සිකුරාද | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.16 | සිකුරාද | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.23 | සිකුරාද | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.30 | සිකුරාද | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් | 66.10. 7 | සිකුරාද | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.14 | සිකුරාද | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.20 | බ්‍රහස්පතින්ද | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.27 | බ්‍රහස්පතින්ද | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් | 66.11. 3 | බ්‍රහස්පතින්ද | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.10 | බ්‍රහස්පතින්ද | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.18 | සිකුරාද | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.25 | සිකුරාද | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් | 66.12. 2 | සිකුරාද | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12. 9 | සිකුරාද | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.16 | සිකුරාද | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12.23 | සිකුරාද | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.30 | සිකුරාද | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

1966 පෙබරවාරි 17 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංස්ථාවේ හි නිපදවන ලද කඩදාසිවල
**ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි**